# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින්
2026 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 දෙසැම්බර් මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[50 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ වීම නතර කිරීම වේ.

***3 වන, 4 වන සහ 5 වන වගන්ති:*** මෙම වගන්ති මගින් කරනු ලබන සංශෝධන 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන)**

එල්.ඩී. - ඕ 62/2023

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක        දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1972 අංක 10 දරන පනතෙහි දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ දීර්ඝ නාමය, **''නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට''** යන වචන වෙනුවට **''නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට''** යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

PL 15623 - 342 (2026/01)

**නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සහ නැව් නියෝජිතයන්,නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන් යන්න පිළිවෙලින්, නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබා දීමේ පනත සහ නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන් සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව**

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක -

(අ) "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත" යන වචන වෙනුවට "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබා දීමේ පනත" යන වචන; සහ

(ආ) "නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්" යන වචන වෙනුවට "නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන් සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්" යන වචන,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක, "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත" පිළිබඳව වන සෑම සඳහන් කිරීමක් ම, "නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට බලපත්‍ර ලබාදීමේ පනත" පිළිබඳ සඳහන් කිරීමක් වශයෙන් කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "කන්ටේනර් මෙහෙයුම්කරුවන්" යන යෙදුමෙහි අර්ථ නිරූපණය ඉවත් කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ව්‍යාවර්තන සහ අන්තර්කාලීන විධිවිධාන**

**5.** වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක කුමක් සඳහන් ව තිබුණ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට -

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ කන්ටේනර් මෙහෙයුම්කරුවකු සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පොරොත්තුව තිබෙන යම් ඉල්ලුම් කිරීමක්, 2026 අංක        දරන කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ විධිවිධාන යටතේ සිදු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට නිශ්චිතව අත්හිටුවනු ලැබ ඇත්නම් හෝ අවලංගු කර ඇත්නම් මිස, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින හෝ බලපැවැත්වෙන කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට නිකුත් කරන ලද සියලු බලපත්‍ර, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි 2026 අංක        දරන කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව